# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 42/21 — 1973 ජනවාරි 15 වැනි සඳුද — 1973.01.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (22) /73.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වැනි අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1973 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

**නියෝගය**

1. (1) යම් නීතියක කුමක් සඳහන්ව ඇතද, එය නොතකා කිසිම උසාවියක් විසින්, පොදු ආයතනයක් සතු යම් දේපළක් සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 367 වැනි වගන්තිය, 370 වැනි වගන්තිය, 386 වැනි වගන්තිය, 389 වැනි වගන්තිය, 391 වැනි වගන්තිය හෝ 394 වැනි වගන්තිය යටතේ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ හෝ එබඳු වරදක් සම්බන්ධයෙන් අත් අඩංගුවේ රඳවාගෙන සිටින යම් තැනැත්තකු නීතිපතිගේ ලිඛිත අනුමැතිය ඇතිව මිස ඇප පිට නිදහස් කරන ලෙස නියම නොකළ යුතුය.

(2) මේ නියෝගයෙහි " පොදු ආයතනය " යන්නෙන්—

(අ) සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් ;

(ආ) බැංකුවක් ;

(ඇ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ;

(ඈ) මූලධනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් රජය විසින් සපයනු ලැබ ඇති යම් සංස්ථාවක්

අදහස් වන අතර, ඒවා ඊට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

26/57—කේ 18852—2,500 (72/12)